# තනතුරු - ඇබෑර්තු

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත පුරප්පාඩු තනතුර සඳහා සේවකයින් බඳවා ගැනීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු ඇති පහත සඳහන් තනතුරු වලට සුදුස්සන් තෝරාපත්කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට වඩා වැඩි කාලයක් ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර දෛනික දීමනා මත බඳවා ගන්නා තනතුරකි. එම තනතුර සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**01. රියදුරු - (PL 3 10/2025 -) පුරප්පාඩු සංඛ්‍යාව -01**

- වැටුප් පරිමාණය -

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 සංශෝධනයට අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප වන්නේ රු. 42,730.00 හා ජීවන වියදම් රු.17,800.00 ක් සමග රු. 60,530.00 ක් වේ.

- **බඳවා ගැනීමේ සුදුසුකම්.-**

    i. වයස - තනතුර සඳහා අයදුම් පත් භාරගන්නා අවසන් දිනය වනවිට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි වියයුතුය.

    ii. අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල,දෙමළ,ඇතුළුව සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම.

    iii. ශිල්පීය නිපුණතා පළපුරුද්ද - මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත්කරන ලද නිපුණත්වය පිළිබඳ සහතික පත් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

    iv. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 පලපුරුද්ද.(සේවා සහතිකයක් මගින් සහතික කළ යුතුය)

- **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය - 2026. 01. 30 වේ. .**

**02. ක්ෂේත්‍ර කම්කරු (PL – 1 – 10/2025) - පුරප්පාඩු - 04**

- වැටුප් පරිමාණය -

  රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 10/2025 සංශෝධනයට අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප වන්නේ රු. 40,000.00 හා ජීවන වියදම් දීමනාව රු. 17,800.00 සමග රු. 57,800.00

- අධ්‍යාපන සුදුසුකම් -

  රජයේ පාසලක 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම.

- වයස් සීමාව - වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**03. කාර්යාල කාර්ය සහායක - (පුරප්පාඩු සංඛ්‍යාව - 01 )**

- **වැටුප් පරිමාණය -**

  රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛන 10/2025 සංශෝධනයට අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප වන්නේ රු. 40,000.00 හා ජීවන වියදම් දීමනාව රු. 17,800.00 සමග රු. 57,800.00 ක් වේ.

- අධ්‍යාපන සුදුසුකම් -

  අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ.) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)

- වයස් සීමාව -

  අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

* අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් විය යුතුය.

**04. බඳවාගැනීම් ක්‍රමය :**

අයදුම්පත් ඉදිරිපත් කිරීම, කැඳවන අවස්ථාවේ හෝ අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

**05. ඉල්ලුම් කළ යුතු ආකාරය:**

1. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම් පතක් **2026.01.30** දිනට හෝ එදිනට පෙර ලේකම් ප්‍රාදේශීය සභාව නිකවැරටිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් පත් බහාලන කවරයේ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කල යුතු වේ.

2. අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. ඉදිරිපත් කළ යුතු ලේඛන :

   1. උප්පැන්න සහතිකය.
   2. අධ්‍යාපන සහතිකය.
   3. පදිංචිය පිලිබඳ ග්‍රාම නිලධාරි/ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහතිකය.
   4. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය )
   5. පළපුරුද්ද පිළිබඳ සහතිකය.
   6. වෘත්තිය සුදුසුම් පිළිබඳ සහතිකය

ලේකම්,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.